**ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

----------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

----------------------------------------

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළුතර දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන් දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයට අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් සිදුකර තිබුණු නිර්දේශ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ක්‍රියාත්මක කර තිබුණු බව.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල සෞඛ්‍ය අමාත්‍යාංශයට ස්ථාන මාරු වී ගිය නිලධාරියකුගේ රු.233,750 ක ණය ශේෂය 2019 වර්ෂයේ අවසාන භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන අනුව නිරවුල් වී තිබුණද මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කර නොතිබුණි. | අවසාන භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු වීම. | අවසාන භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන නොලැබීම හේතුවෙන් ගිණුමේ පෙන්නුම් කර නොමැත. |

### 1.6.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය. එසේම, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කරගන්නා ලදි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ගොඩනැගිලි සහ ඉදිකිරීම් (2001) යටතේ වාර්ෂික ප්‍රතිපාදන වශයෙන් රු.20,000,000 ක් වෙන්කර තිබුණු අතර මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් යටතේ රු.32,000,000 ක්ද අතිරේක ප්‍රතිපාදන ලෙස ලබාගෙන තිබුණි. මෙය ඇස්තමේන්තු වටිනාකමින් සියයට 160 ක වැඩිවීමකි. මේ අනුව අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව ඇස්තමේන්තු සකස් කර ඇති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති නිසිපරිදි ඇස්තමේන්තු කිරීම සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම | පැරණි දිස්ත්‍රික් ලේකම් නිල නිවස නවීකරණයට අවශ්‍ය අමාත්‍යාංශ ප්‍රතිපාදන ලබා ගැනීම අපේක්ෂා කලද 2104 වැය විෂයේ ඉතිරි ප්‍රතිපාදනය තිබූ බැවින් එය භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අනුමැතිය මත 2001 වැය විෂයට මාරු කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රජා මූලික හරිත සමාජ (Green Club) ක්‍රියාකාරකම් ආරම්භ කිරීම වෙනුවෙන් 2509 (වෙනත්) වැය විෂයය යටතේ පරිපූරික ඇස්තමේන්තු මගින් රු.2,700,000 ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණද ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම නිසා සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම ඉතිරිවී තිබුණි. | -එම- | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මතුගම හා බුලත්සිංහල ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන ලැබී ඇතත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පැන නැගුණු ගැටළුකාරි තත්ත්වයන් හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම. |
| (ඇ) | 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛය මගින් ලබාදෙන ලද වියදම් වෙනුවෙන් වෙන්කර ඇති ප්‍රතිපාදනවලින් සියයට 25 ක් අනිවාර්යයෙන්ම ඉතිරි කළයුතු බව දක්වා තිබුණද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැඩසටහන් 1 හා 2 හි සමස්ථ ශුද්ධ මූලධන ප්‍රතිපාදනය වූ රු.246,700,000 න් ඉතිරිකර තිබුණේ රු.20,833,608 ක් හෙවත් සියයට 8.5 ක් පමණි. | 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කිරීම. | ප්‍රතිපාදන ඉතිරිකිරීම් කළමනාකරණය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් සිදුකර ඇත. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුනරාවර්තන වැය විෂයයන් 6 ක ප්‍රතිපාදන ඉක්මවා රු.883,016 ක බැරකම්වලට බැඳී තිබුණි. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොඑළඹීම. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ ඇති බව පිළිගනිමි. ඉදිරියේදී මෙසේ සිදු නොවීමට වගබලා ගනිමි |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් රු.6,911,987,912 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර එයින් රු.5,506,433,680 ක් එනම් ලබාදුන් ප්‍රතිපාදනයෙන් සියයට 80 ක් වැයකර තිබුණි. දෙපාර්තමේන්තු දෙකක රු.1,145,750 ක සම්පූර්ණ ප්‍රතිපාදන මුදලද එක් අමාත්‍යාංශයක ප්‍රතිපාදන වලින් රු.39,479,020 ක මුදලක්ද ඇතුලත්ව එකතුව රු.40,624,770 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් උපයෝජනය කර නොතිබුණි. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීම | ජාතික අයවැය චක්‍රලේඛ අංක 05/2019 අනුව වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘති අතහැර දැමීම. |

## 2.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කර තිබූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ හා පළාත් සභා ආයතනවලට ස්ථාන මාරු වී ගිය, මිය ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැරගොස් ඇති නිලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,196,883 ක් විය. එම හිඟහිටි ශේෂ මාස 3 සිට වර්ෂ 5 දක්වා කාල පරාසයක් ගතවී තිබුණත් ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. | ස්ථාන මාරු වී ගිය, මියගිය,විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැරගොස් ඇති නිලධාරීන්ගේ ණය ශේෂ, ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පළාත් සභාවලට මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමටත්, මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවති. විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ විශ්‍රාම වැටුපෙන් හා විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කරන ලෙස අදාල නිලධාරියාට දැන්වීම හා ඇපකරුවන්ගෙන් අයකිරීමටත් කටයුතු කෙරේ. අය නොවන |

| | | |
|---|---|---|
| | | ණය සඳහා නීති උපදෙස් ලබාගැනීම හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 369 පරිදි කටයුතු කිරීමටත්, සේවය හැරගොස් ඇති නිලධාරීන්ගේ ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හා ණය ශේෂ කපා හැරීමටත් කටයුතු කරමින් පවතී. |

2.5 **තැන්පතු ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 2ක් ඉක්මවූ රු. 184,364,618 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. . | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මෝදරවිල ක්‍රීඩාංගනය 2014 වර්ෂයේ සිට ඉදිකිරීම් ආරම්භ කර, මේ දක්වා රු. මිලියන 3.70 කට අධික මුදලක් වියදම් කර තිබුණ ද නියමිත සැලසුමකට අනුව වැඩ නිමකර නොතිබුණි. | නියමිත සැලසුමකට අනුව වැඩ නිම කළ යුතු වීම. | ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර ඇතත් ඒ සඳහා ප්‍රතිපාදන ලැබී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගම්පෙරළිය ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති හඳුනාගැනීමේදී 2018 ජූලි 13 දිනැති MNPED 05/2018 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛයේ 4(ආ) වගන්තිය අනුව මහජනතාව වෙත උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් දේශපාලන අධිකාරය සමග සාකච්ඡා කර තීරණ ගත යුතු විය. එහෙත් ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී වසම් 32 ක ප්‍රමුඛතාවය ලබාදුන් ව්‍යාපෘති 241 ක් වෙනුවට වෙනත් ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව හඳුනාගනු ලබන ව්‍යාපෘතිවල ප්‍රමුඛතාවය අනුව එම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වීම. | මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2018.11.09 දිනැති අමාත්‍යමණ්ඩල සංදේශයේ 03 වගන්තියේ ii හා iii අනුව ගිවිසුම් අත්සන් කරන ලද එහෙත් වැඩ ආරම්භ නොකරන ලද ව්‍යාපෘතින් හා මූලික වැඩ කිසිවක් ආරම්භ නොවූ ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම මත ඉංගිරිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහා අනුමත වූ ව්‍යාපෘති 78 න් 2018 වර්ෂය තුළදී කිසිවක් ක්‍රියාත්මක කර නොමැත. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බණ්ඩාරගම රේරුකාන වෙල්යායට පිවිසීමට කෘෂි පාරක් ඉදිකිරීම සඳහා දක්ෂිණ ලංකා අධිවේගී මාර්ග ව්‍යාපෘතිය මගින් 2011 අගෝස්තු 17 දින රු.931,950 ක් ලබාදී තිබුණු අතර එම ව්‍යාපෘතිය ආරම්භ නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබීම නිසා කුඹුරු ඉඩම් අක්කර 20 ක් වසර ගණනාවක සිට පුරන්ව පැවතුණි. | අවශ්‍යතාවයන් මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කළ නොහැකි නම් මුදල් ආපසු යැවීම. | කුඹුරු ඉඩම් පර්චස් 17 ක් පමණ ගොඩවන බැවින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබෙන තෙක් රඳවාගෙන ඇත. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගම්පෙරළිය ව්‍යාපෘතිවලට අදාල කොන්ක්‍රීට් මාර්ග ඉදිකිරීම්වල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා එම මාර්ගයෙන් ලබාගන්නා ලද කොන්ක්‍රීට් කුට්ටිගල් භෞතික පරීක්ෂාව සඳහා රැගෙන යාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් විසින් සිදුකළ යුතු විය. එහෙත් ව්‍යාපෘති 488 ක කුට්ටිගල් පරීක්ෂාව සඳහා රු.2,153,880 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | කුට්ටිගල් සාම්පල් පරීක්ෂා කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ඉඩ ලබා නොදී රජයේ නිලධාරීන් විසින්ම සිදුකිරීම සහ ඒ සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් නොකිරීම. | කුට්ටි ගල් පරීක්ෂාවට ගෙවීම් කිරිම ඇස්තමේන්තුවට ඇතුලත් කර ඇති හෙයින් බිල් පත්වලට ගෙවීම් කිරිම කොන්ත්‍රාත්කරු නමින් සිදු කරනු ලබයි. |
| (ආ) | ඉංගිරිය, හොරණ හා පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනෙහි 2018 සහ 2019 වර්ෂවල ඉදිකර තිබූ පිරිවැය රු.475,599,835 ක් වූ කොන්ක්‍රීට් මාර්ග 946 ක කොන්ක්‍රීට් තට්ටුවේ ඝනකම පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණි. | කොන්ක්‍රීට් තට්ටුවේ ඝනකම පිරිවිතරයන් සමග සැසඳමෙන් පසුව පමණක් ගෙවීම් කිරීම | 2020 වර්ෂයේ සිට කොන්ක්‍රිට් මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කොන්ක්‍රිට් තට්ටුවේ ඝනකම පරීක්ෂා කරන ලෙස උපදෙස් ලබා දී ඇත. |
| (ඇ) | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් උසස් ගුණත්වයකින් මාර්ග ඉදිකිරීම් පවත්වාගෙන යායුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකක ඉදිකළ පිරිවැය රු.7,954,337 ක් වූ මාර්ග 8ක් ඉදිකර කෙටි කාලසීමාවක් තුලදී ඉරිතැලීම, ගිලා බැසීම් හා තාර යොදා ඉදිකර තිබූ මාර්ගවල පළුදුවීම් භෞතික පරීක්ෂාවේදී දක්නට ලැබුණි. | ඉදිකිරීම් උසස් ගුණාත්මක මට්ටමකින් පවත්වාගෙන යා යුතු බව සහ එසේ පවත්වාගෙන යන බවට නිසි අධීක්ෂණයක් තිබීම | මෙම මාර්ග පරීක්ෂාකර බලා පිළියම් සකස් කිරීමට කොන්ත්‍රාත්කරුවන්ට උපදෙස් ලබාදී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකර තිබුණු පිරිවැය රු.3,419,127 ක් වූ මාර්ග 6 ක් මාර්ගයේ මුල් කොටස හා අග කොටස ඉදි නොකොට මැද කොටස පමණක් ඉදිකර තිබීම නිසා මාර්ගයක් ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි. | මාර්ගයක කොටසක් පමණක් ඉදිනොකර සම්පූර්ණව ඉදිකිරීම | ප්‍රතිපාදන ලැබෙන ආකාරය අනුව අත්‍යාවශ්‍ය කොටස් පමණක් සංවර්ධනය කිරීම. |

**3.4 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ ග්‍රාම නිලධාරී වසම්වලට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන්ට පහසුකම් සහිත කාර්යාල ලබාදීමේ අරමුණින් 2015 සහ 2016 වර්ෂවලදී රු.10,750,000 ක් වැයකර ආරම්භ කරන ලද බහුකාර්ය ගොඩනැගිලි 4 ක්, සේවා පියස 5 ක් හා නිල සෙවන ගොඩනැගිල්ලක් සම්පූර්ණයෙන් වැඩ අවසන් නොකර අතරමග නවතා දමා තිබුණි. | ප්‍රතිපාදන ලබා ගෙන වැඩ අවසන් කිරීම | ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් සම්පූර්ණයෙන් වැඩ අවසන් කිරීමට නොහැකි වී ඇත. |
| (ආ) | කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ රු.මිලියන 108.48 ක ව්‍යාපෘතිය 2017 පෙබරවාරි 13 දින ආරම්භ කර 2018 මැයි 20 දින වනවිට වැඩ අවසන් කළයුතු වුවත් රු. මිලියන 42.9 ක් වූ සියයට 22.5 ක වැඩ ඉටුකර ඉදිකිරීම් අතරමග නතරකර තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීම, කොන්ත්‍රාත් ප්‍රදානයේදී කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් නිසි ඇගයීමක් සිදුකිරීම, සහ කාර්යසාධන සුරක්ෂණ මුදල් බවට පත් කර ගැනීම. | කොන්ත්‍රාත් ආයතනයේ මූල්‍ය අපහසුතා නිසා කොන්ත්‍රාත් වැඩ අතරමග නතර වී ඇත. කෙසේ වෙතත් නැවත මිල ගණන් කැඳවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මතුගම සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.18,529,124 ක බදු රහිත මුදලකට කොන්ත්‍රාත් ආයතනයක් සමග ගිවිසුම්ගත වී සියයට 60 ක ඉදිකිරීම් සිදුකර සියයට 84 ක් ගෙවීම් කර තිබියදී ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් කිරීම සහ සිදු වී ඇති අඩුපාඩු නිවැරදි කර ගනිමින් අතරමග වැඩ නතර කර ඇති ව්‍යාපෘතියේ වැඩ නිම කිරීම. | NBRO ආයතනයේ නිර්දේශ මත ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා කරන ලද අමතර කාර්යයන් සඳහා ගෙවීම් නොකිරීම හේතුවෙන් අදාල කොන්ත්‍රාත්කරු මේ වන විට ඉදිකිරීම් කාර්යය නවතා ඇත. |

**3.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ<br>--------------------------- | නිර්දේශය<br>---------------- | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------------------------- |
|---|---|---|---|
| (අ) | බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුංහේන සංසමිත්තා ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.2,341,259 ක් ජාතික ජලසම්පාදන හා ජලපවහන මණ්ඩලය වෙත 2018 වර්ෂයේදී ගෙවා තිබුණි. නමුත් මාර්ග පළුදු කිරීම වෙනුවෙන් වන භෞතික හානි සඳහා බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.1,941,970 ක් නොගෙවීම නිසා 2020 ජුනි 10 වන දින වනවිටත් අදාල ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු මුදල ගෙවා ව්‍යාපෘතිය ආරම්භ කිරීම හෝ ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවා ඇති මුදලින් ඉතිරි රු.630,500 ආපසු ගෙන්වා ගැනීම. | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.1,941,970 ක ප්‍රතිපාදන නොලැබීම නිසා 2018 වර්ෂයේදී ජාතික ජලසම්පාදන හා ජලප්‍රවහන මණ්ඩලය වෙත ගෙවා ඇති රු.1,710,759 ක මුදල නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොරකාන ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා 2014 සිට 2018 වර්ෂය දක්වා රු.7,524,970 ක් වියදම් කර තිබුණද නඩත්තු කටයුතු නිසි ආකරයෙන් සිදු නොකිරීම නිසා සිදුකරන ලද සංවර්ධන කටයුතු විනාශ වෙමින් පැවතුණි. | ක්‍රීඩාංගනය ප්‍රයෝජනයට ගතහැකි ආකාරයට සකස්කර නඩත්තු කටයුතු සිදුකිරීම | නඩත්තු කටයුතු ප්‍රාදේශීය සභාව මගින් කල යුතු අතර නිසි පරිදි නඩත්තු කටයුතු පවත්වා ගැනීම සඳහා ප්‍රාදේශීය සභාව වෙත ලිපියකින් දන්වා ඇත. |

## 3.6 ප්‍රසම්පාදනයන්

(අ) බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ ලියාපදිංචි සමිති 47 කට බෙදාදීම සඳහා 2019 වර්ෂය තුළ රු.2,653,885 ක් වැයකර මිලදී ගෙන තිබුණු ශබ්ද විකාශන යන්ත්‍ර සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2(ඇ) අනුව ශබ්ද විකාශන යන්ත්‍ර මිලදී ගැනීම සම්බන්ධව පිරිවිතර හා ලංසු ලේඛන සකස්කර නොතිබුණි. | මිල ගණන් කැඳවීමට පෙර පිරිවිතර හා ලංසු ලේඛන (Bidding Document) සකස් කිරීම. | ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා පිරිවිතරයන් සඳහන් කර මිල ගණන් කැඳවීම සිදුකර ඇත. |
| (ii) | 2019 නොවැම්බර් 30 දිනට පෙර ව්‍යාපෘතියේ ඉදි කිරීම් අවසන් කළ යුතු වුවද 2019 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. ශබ්ද විකාශන යන්ත්‍ර 2019 දෙසැම්බර් 31 දින ඇණවුම් කර 2020 ජනවාරි 23 විගණන දින වනවිටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී නොතිබුණි. ශබ්ද විකාශන යන්ත්‍ර මිලදී ගැනීමේ වියදම 2019 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කරද තිබුණි. | නියමිත කාල රාමුව තුල ප්‍රසම්පාදන කටයුතු අවසන් කර භාණ්ඩ ලබා ගැනීම. | ව්‍යාපෘතිය අවසන් කළයුතු දිනය 2019/12/31 දක්වා දින දීර්ඝ කර ඇත. ඒ අනුව 2019/12/31 අවසන් වර්ෂය තුලදී ගෙවීම් කිරීමට මුදල් ප්‍රතිපාදන නොතිබූ බැවින් 2019 අතැති බිල් වශයෙන් සටහන් කරන ලදි. |
| (iii) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1(ආ) 2.6.1(අ)(1) සහ 4.1.1(අ) අනුව ශබ්ද විකාශන යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව සැලසුම් සකස් කළ යුතු වීම. | පිළිගනිමි. ඉදිරියේ මෙවන් අඩුපාඩු සිදු නොවන ලෙස කටයුතු කරන බව. |
| (iv) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 අනුව රු.2,653,885 ක වටිනාකම වූ ශබ්ද විකාශන යන්ත්‍ර මිලදී ගන්නා ලද පුද්ගලික සමාගම සමග විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන්කර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ගිවිසුම් අත්සන් කළ යුතු වීම. | පිළිගනිමි. ඉදිරියේ මෙවන් අඩුපාඩු සිදු නොවන ලෙස කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| (v) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.1 වගන්තිය අනුව ශබ්ද විකාශන යන්ත්‍ර මිලදී ගැනීම කළයුතු වුවත් ලැබුණු මිලගණන් තුනෙන්, දෙකක් තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ඇගයීමෙන් තොරව ඉවත් කර ඉතිරි ලංසුව පමණක් තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් කරන ලද නිර්දේශ කිරීම මත ප්‍රසම්පාදන කමිටුව විසින් පුද්ගලික සමාගමකින් ශබ්ද විකාශන යන්ත්‍ර මිලදී ගැනීම අනුමත කර තිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ඵලදායී තරඟකාරීබවක් නොමැති බව පැහැදිළිව පෙනෙන විට, ලැබී ඇති ලංසු ප්‍රතික්ෂේප කර නැවත මිල කැඳවීම. | තාක්ෂණික කමිටුව විසින් මිල ගණන් හා භාණ්ඩ භෞතිකව පරීක්ෂා කර ඇගයීම් වාර්තාව ඉදිරිපත් කරන ලද බව හා එය සැලකිල්ලට ගෙන මිලදී ගැනීමට තීරණය කරන ලද බව |
| (ආ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය අනුව ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව 2019 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ප්‍රදානය කර තිබුණු රු.1,691,000 ක වටිනාකම වූ ව්‍යාපෘති 4 ක් සඳහා උප කොන්ත්‍රාත් නොදෙන බවට ලිඛිත තහවුරුවක් සහිතව බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. එහෙත් ප්‍රාදේශීය සභාව විසින් එම ව්‍යාපෘති උප කොන්ත්‍රාත් දී තිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කිරීම සහ උප කොන්ත්‍රාත් ලබා නොදිය යුතු කොන්ත්‍රාත් එලෙස උප කොන්ත්‍රාත් ලබා නොදීම. | ගිවිසුම්ගත වීමේදී උප කොන්ත්‍රාත් ලබානොදෙන බවට ලිඛිත තහවුරුවක් ලබාගෙන ඇති බව. |
| (ඇ) | නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත බුලත්සිංහල සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සම්බන්ධයෙන් පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 වගන්තිය අනුව සීමිත මිල ගණන් කැඳවීම සඳහා දින 21 ක් ලබා දිය යුතු වුවත් දින 14ක් පමණක් ලබාදී තිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | කාලය සීමිත බැවින්, සීමිත මිළ ගණන් කැඳවීම යටතේ සුදුසුකම් ලත් කොන්ත්‍රාත් ආයතන 10 කින් මිළ ගණන් කැඳවා දින 14 කින් අවසන් කරන ලදි. |
| (ii) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.1.2 වගන්තිය අනුව ඵලදායී තරඟකාරී බවක් නොමැති බව පැහැදිලිව පෙනෙන විට මිල ගණන් නැවත කැඳවිය යුතුය. නමුත් එසේ සිදු නොකර ලැබී තිබුණු එකම මිල ගණන ඉංජිනේරු ඇස්තමේන්තුවට වැඩි වුවත් ඉංජිනේරු ඇස්තමේන්තුවට කොන්ත්‍රාත්තුව ලබාදීමට තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | එක් මිළ ගණන් පත්‍රයක් ලැබී තිබුණ ද නැවත මිල ගණන් කැඳවීමට ප්‍රමාණවත් කාලයක් නොතිබූ බැවින්, රජයේ ඇස්තමේන්තු මුදලට කොන්ත්‍රාත්තුව අදාල ආයතනය වෙත පිරිනැමීමට තාක්ෂණ ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව තීරණය කරන ලදී. |

**3.7. වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය අතර කාලය තුළදී බුලත්සිංහල හා පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ තුළ රු.42,479,672 ක් වැයකර ඉදිකර තිබූ සංස්කෘතික මධ්‍යස්ථාන දෙක මේ දක්වා භාවිතයට ගෙන නොතිබුණි. | අවශ්‍ය උපකරණ මිලදීගෙන ඉදිකර ඇති ගොඩනැගිලි භාවිතයට ගැනීමට කටයුතු කිරීම. | අවශ්‍ය උපකරණ මිළදී ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම මත ගොඩනැගිලි භාවිතයට ගැනීමට නොහැකි වී ඇත. |
| (ආ) | පානදුර සහ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශවල ක්ෂේත්‍ර නිලධාරීන්ට පහසුකම් සහිත කාර්යාල ලබාදීමට 2014 සිට 2016 වර්ෂවලදී රු.14,334,381 ක් වැයකර ඉදිකර තිබූ බහුකාර්ය ගොඩනැගිලි 5 ක් සහ සේවා පියස 3 ක් 2020 ජුනි 10 දින වනවිටත් භාවිතයට ගෙන නොතිබුණි. | ගොඩනැගිලිවල අයිතිය ලබා ගැනීම සහ වැඩ කඩිනමින් නිමකර හා කාර්යාල ආරම්භ කිරීම, අයිතිය නොමැති ඉඩම්වල ගොඩනැගිලි ඉදි නොකිරීම. | බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ වසම් දෙකක ඉදිකළ ගොඩනැගිලි කාර්යාල පවත්වාගෙන යාමට ඉඩලබාදෙන ලෙස ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලා ඇත. නිවාස සංවර්ධන අධිකාරියට අයත් ඉඩමේ ඉදිකළ ගොඩනැගිල්ල ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් වැඩ අවසන් කිරීමට නොහැකි වී ඇත. |
| (ඇ) | කළුතර පැරණි දිස්ත්‍රික් ලේකම් නිලනිවස වර්ෂ 2017-2018 කාල පරාසයේදී රු.37,548,501 ක් වැයකර සංචාරක නිවාසයක් ලෙස නවීකරණය කර තිබුණද 2019 වර්ෂය තුල දින 04 ක වෙන්කිරීමක් පමණක් සිදුවී තිබුණි. | නිලධාරීන්ගේ නිවාඩු නිකේතනයක් ලෙස භාවිතයට ගැනීමට කටයුතු කිරීම. | කළුතර පැරණි දිස්ත්‍රික් ලේකම් නිල නිවස 2020 වර්ෂයේ නිවාඩු නිකේතනයක් ලෙස භාවිතයට ගැනේ. කොවිඩ් වසංගත තත්ත්වය නිසා 2020 මාර්තු 15 වන දින සිට ජුනි 30 දක්වා ලබාදීම නතර කර 2020 ජුලි 01 දින නැවත ලබාදී ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 661/A කොතලාවල ග්‍රාම නිලධාරී වසමේ ප්‍රාදේශීය සහා ඉඩමක සේවා පියස ඉදිකිරීම වෙනුවෙන් 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා විවිධ ව්‍යාපෘති යටතේ රු.3,729,024 ක් වැයකර තිබුණද ඉදිකරන ලද ගොඩනැගිල්ලට අයත් භූමිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම පවරා ගැනීමට කටයුතු කිරීම. | ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමින් පවතී. |

**3.8** **පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක රු.1,961,288 ක අලාභ හානි සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | අලාභ හානි හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කිරීම. | පොත්වලින් ඉවත් කිරීට කටයුතු කරනු ලැබේ. |
| (ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක 252-9804 දරන කැබ් රථය 2017 ජුනි 15 වන දින අනතුරට ලක්වී අළුත්වැඩියාව සඳහා රු.159,100 ක් වැයකර තිබුණද මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම | වාහන අනතුරින් වූ අලාභය අය කරගැනීම සඳහා පොලීසිය විසින් නඩු පවරා ඇති අතර රාජකාරි අවශ්‍යතාවය අනුව වාහන අළුත්වැඩියා කරන ලදි. අනතුර පිළිබඳව මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. |

**3.9** අනාර්ථික ගණුදෙණු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 හි ඉදිකර තිබූ ග්‍රාමීය මාර්ග 2893 ක අඩි 4×2.5 ප්‍රමාණයේ නාම පුවරු සවිකිරීම වෙනුවෙන් 2019 වර්ෂයේදී රු.17,358,000 ක් වැයකර තිබුණි. | ඵලදායී නොවන කාර්යයන් සඳහා මුදල් වියදම් නොකිරීම. | වර්ථමානයේදී සිදු කරන ව්‍යාපෘති වෙනුවෙන් නාම පුවරු ප්‍රදර්ශනය නොකරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දී ඇත. |

**3.10** කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේදී කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක ව්‍යාපෘති 735 ක් අධීක්ෂණය කිරීම වෙනුවෙන් රු. 4,402,966 ක් ගෙවීම් කර තිබුණි. එම ගෙවීම් සඳහා මිනුම්පත්‍ර ලබාගැනීම, වැඩබිමට රැගෙන එන අමුද්‍රව්‍යවල මැනුම් ලබාගැනීම ආදී කටයුතු කාර්මික නිලධාරීන් විසින් සිදු කළ යුතු වුවත් එම කටයුතු ඔවුන් විසින් සිදු කර නොතිබුණි. | අධීක්ෂණ කටයුතු කරන්නේද යන්න සොයාබලා ගෙවීම් කිරීමට ක්‍රමවේදයක් සැකසීම. | තාක්ෂණික නිලධාරීන්ගේ අධික කාර්යබහුලත්වයට පිළියමක් වශයෙන් භෞතික වැඩ තත්ත්වයන් නිරීක්ෂණය තාකිෂණික නිලධාරීන්ගේ අධික්ෂණය සහ උපදෙස් යටතේ වසම් භාර සංවර්ධන නිලධාරීන් යොදවා ගන්නා ලදි. එහෙත් තාක්ෂණ නිලධාරීන් එම කාර්යයන්ගෙන් බැහැර කිරීමට හෝ වෙනත් නිලධාරීන්ට යොමු කිරීමට කටයුතු සිදු කර නොමැත.මෙම කටයුතු නිසි පරිදි කිරීමට ඉදිරියේදී වැඩි අවධානයක් යොමු කරවන ලෙස හා අදාළ කාර්යයන් පිළිබඳ තාක්ෂණික නිළධාරීන් දැනුවත් කරන ලෙස ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත උපදෙස් ලබා දීමට සටහන් කර ගන්නා ලදී. |
| (ආ) ඉදිකිරීම් ව්‍යාපෘති ආරම්භයේ සිට අවසානය දක්වා අධීක්ෂණය සංවර්ධන නිලධාරීන් වෙත පවරාදීම නිසා සකස්කළ ඇස්තමේන්තු පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ඔවුන් සතුව නොමැති වීමෙන් භාවිතා කළයුතු අමුද්‍රව්‍ය අවශ්‍යතාවයන් හා වැඩබිමට රැගෙන එන අමුද්‍රව්‍ය මිනුම් කිරීමට තාක්ෂණික දැනුමක් ඔවුන් තුල නොතිබීම. | සුදුසුකම් සහිත නිලධාරීන්ට අධීක්ෂණ කටයුතු පැවරීම | |

3.11 වංචනික ස්වරූපයේ ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත සංවර්ධන නිලධාරියකු රාජකාරි කාලය තුල කළුතර නාගොඩ පෞද්ගලික ආයතනයක යන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් සේවය කර තිබුණි. යන්ත්‍ර ක්‍රියාකරු ලෙස වැටුප් ලබන ලද 2013 සැප්තැම්බර් 20 දින සිට 2019 අගෝස්තු 07 දක්වා කාලය තුල සංවර්ධන නිලධාරී රාජකාරි කිරීම වෙනුවෙන් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වැටුප් හා දීමනා ලෙස රු.2,391,921 ක් ගෙවා තිබුණි. | විධිමත් පරීක්ෂණයක් සිදු කර එම වාර්තාවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතු වීම. | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DP/6/24/2019 හා 2019 අගෝස්තු 08 දිනැති ලිපිය මගින් නිලධාරියාගේ වැඩතහනම් කර ඇති අතර නිලධාරියා අධීක්ෂණය කිරීම සහකාර අධ්‍යක්ෂ සැලසුම් වෙත පවරා ඇත. |

**4. යහපාලනය**

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපිත කර තිබුණු අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කිරීමේ කටයුතුද කරන තත්ත්වයක් යටතේ එහි ස්වාධීනත්වයට බාධා පවතින බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 134(1) ප්‍රකාරව ස්ථාපිත කර ඇති අභ්‍යන්තර විගණන ඒකකයේ ස්වාධීනත්වය තහවුරු කිරීම. | අභ්‍යන්තර විගණන ඒකකයේ ස්වාධීනත්වය තහවුරු කිරීමට පියවර ගනු ලැබේ. |

5. **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් තනතුරේද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරුද පුරප්පාඩු වී පැවතුනි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු තනතුරු කඩිනමින් සම්පූර්ණ කිරීම. | අනුමත, දැනට සිටින පුරප්පාඩු සහ අතිරික්ත සේවක තොරතුරු සෑම මසකම අවසානයේදී අමාත්‍යාංශය වෙත දැනුම් දෙනු ලැබේ. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සැලසුම් තනතුර පුරප්පාඩු වී පැවතියද කළුතර, පානදුර හා බණ්ඩාරගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නියෝජ්‍ය අධ්‍යක්ෂ සැලසුම් තනතුරු 3 ක අතිරික්තයන් නිරීක්ෂණය විය. | පුරප්පාඩු තනතුරු කඩිනමින් සම්පූර්ණ කිරීම හා අතිරික්ත නිලධාරීන් පුරප්පාඩු ඇති ස්ථානවලට ස්ථාන මාරු කිරීම. | -එම- |
| (ඇ) | කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වසර 5 සිට වසර 14 දක්වා සේවයේ නියුතුව සිටින සංවර්ධන ක්ෂේත්‍ර නිලධාරීන් 9 ක් ස්ථාන මාරුකර නොතිබුණි. | කාලානුරූපීව ස්ථාන මාරුකිරීම කළ යුතු වීම. | ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර කාර්යයන් සඳහා අවහිරතාවයක් නොවන ආකාරයට ක්‍රමානුකූලව පියවරින් පියවර නිලධාරීන් සඳහා ස්ථාන මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. |